# පුංචි සුරංගනාවී



W.M. සෙනුලි ශෙහන්සා වීරසිංහ

# පුංචි සුරංගනාවී

## සෙනුලි ගෙහන්සා වීරසිංහ

**කතෘ**

**කතෘගේ වෙනත් කෘති :**

මලිදුට පාඩමක්

අපුරු මිතුදම

ලස්සන පවුලක්

උද්‍යානයේ පුංචි තරුව ලිලී

**Greed costs Malidu**

| | | |
|---|---|---|
| පාසල | : | මහ/මහාමායා බාලිකා විදුහල |
| ඉගෙනුම ලබන පන්තිය | : | 6 ශ්‍රේණිය |
| කෘතිය එළි කරන දිනය | : | 2026.05.10 |



| | | |
|---|---|---|
| **ISBN අංකය** | : | **978-624-211-301-2** |

# පිදුම

මගේ ජීවිතේ ආලෝකය දුන්න,

මගේ පළමු ගුරුවරුන් වූ,

මට ආදරය, විශ්වාසය, ලියන්නට දේවල් ඉගැන්වූ

ආදරණීය **අප්පච්චිට, අම්මාට,**

මගේ හිනාවට, කඳුළට, සෙල්ලම් වලට,

සහ මගේ කතා වලට මුල්ම අහන්නන් වූ

ආදරණීය **සහෝදරයාට, අත්තාට, අත්තම්මාට**

අකුරු කියවන්න, වචන ගොතන්න, සිහින දකින්න උගන්වපු,

මගේ දෙවන දෙමාපියන් වූ

ගෞරවණීය **මහාමායා බාලිකා විද්‍යාලයේ ගුරු මහත්ම මහත්මීන්ට,**

මේ මගේ පළමු E කතා පොත

කෘතවේදීත්වයෙන්, ආදරයෙන් පුද කරමි.

**6 ශ්‍රේණිය D**

**මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර**



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.


ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය


CamScanner

## සුභාශිංසන පණිවුඩය.

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිමර්ාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිමර්ාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිමර්ාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාථර්ක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිවර්ාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාථර්කත්වයක් ලබනු ඇතැයි ප්‍රාථර්නා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචායර් , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

## සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව

2026.05.10

ගමේ පුංචි ගෙදරක අවුරුදු 9ක නිපුනි කියලා ගැහැණු ළමයෙක් හිටියා. ඇගේ මූණේ හැමවෙලාවෙම හිනාවක් තිබ්බා. නිපුනි කවුරු හරි දුකෙන් ඉන්නවා දැක්කොත් එයාට ඉවසන්න බෑ. "ම උදව් කරන්නද?" කියලා දුවගෙන යනවා. ඒ නිසා ගෙදර අයයි ඉස්කෝලේ යාලුවෝයි එයාව "අපේ පුන්චි සුරංගනාවිය" කියලා ආදරෙන් කතා කළා.



නිපුනි ඉස්කෝලෙන් ඇවිත් බෑග් එක තියලා මුලින්ම කරන්නේ අම්මගෙන් අහන එක, "අම්මා, අද මම මොනවද කරන්න ඕනේ?" කියලා. අම්මා එළවළු කපනකොට නිපුනි ළඟ ඉඳගෙන බෝංචි කඩා දෙනවා. තාත්තා වෙහෙස වෙලා ආවම වතුර වීදුරුවක් අරගෙන දෙනවා. නිපුනි කියනවා, "තාත්තේ, ඔබතුමා ගොඩක් මහන්සි වෙන්නේ අපි වෙනුවෙන්නේ. ටිකක් විවේක ගන්න." ගෙදර හැමෝම නිපුනිගේ කල්පනාවට පුදුම සතුටුයි.



නිපුනිට අවුරුදු 5ක මල්ලි කෙනෙක් ඉන්නවා, නම නුවන්. නුවන්ට අකුරු ලියන්න අමාරුයි. නිපුනි හැමදාම රෑට නුවන් ළඟ ඉඳගෙන අකුරු ලියන්න කියලා දෙනවා. "නුවන්, මේක 'අ' අකුර. ලස්සනට ලියන්න" කියලා ඉවසීමෙන් කියලා දෙනවා. නුවන්ට පන්තියේ පළවෙනි තැන ගත්තම එයා කිව්වේ, "මේක අක්කගේ නිසා" කියලා.



නිපුනි ඉස්කෝලේ 4 ශ්‍රේණියේ ඉගෙන ගන්නවා. පන්තියේ සශී කියලා කෙල්ලෙක් හිටියා ගොඩක් ලැජ්ජයි. කාත් එක්කවත් කතා කරන්නේ නැහැ. නිපුනි සශී ළඟට ගිහින්, "අපි යාලුවෝ වෙමුද?" කියලා ඇහුවා. ඊට පස්සේ හැම විවේක වෙලාවේම නිපුනි සශී එක්ක සෙල්ලම් කළා. දැන් සශීත් හයියෙන් හිනාවෙනවා. නිපුනි කියන්නේ යාළුවෙක් දුකෙන් ඉන්නවා නම් එයාව තනියෙන් දාන්න හොඳ නෑ කියලා.



නිපුනිගේ පන්ති භාර ගුරුතුමිය නම සුමිත්‍රා මහත්මිය. එයාට ලොකු පොත් ගොඩක් උස්සගෙන යන්න වෙලාවට නිපුනි දුවගෙන ගිහින් උදව් කරනවා. "ගුරුතුමියේ, මම අරන් යන්නද? බර නෑ" කියලා අහනවා. ගුරුතුමිය කියනවා, "නිපුනි වගේ ළමයි ඉන්න එක ගුරුවරයෙකුට ලොකු ශක්තියක්" කියලා.



එක දවසක් ඉස්කෝලේ යන පාරේදී නිපුනි දැක්කා මහළු ආච්චි කෙනෙක් බර බෑග් එකක් අරගෙන යනවා. නිපුනි දුවගෙන ගිහින් බෑග් එක අරගෙන ආච්චිගේ ගෙදරටම අරන් ගියා. ආච්චි ආශිවර්ාද කළා, "දුවා, ඔයා වගේ ළමයි ලෝකේ වැඩි වුණොත් ලෝකය ලස්සන වෙනවා" කියලා.



නිපුනිගේ උපන්දිනයට අම්මා ලස්සන පොත් ටිකක් අරන් දුන්නා. නිපුනි ඒ පොත් ටික ඉස්කෝලේ පුස්තකාලයට දුන්නා. "මට තනියම කියවනවාට වඩා හැමෝම කියෙව්වොත් මට සතුටුයි" කියලා කිව්වා. ගුරුතුමියයි යාලුවෝයි හැමෝම නිපුනිව අගය කළා.



නිපුනි සෙල්ලම් කරනකොට ගසක් යටින් වැටුණු පුංචි කුරුළු පැටියෙක් දැක්කා. එයා වහාම ඒ පැටියා අරගෙන ගෙදර ගෙනත් වතුර දීලා බලාගත්තා. දවස් දෙකින් පැටියා හොඳ වෙලා පියාඹලා ගියා. නිපුනි කියනවා, "පුංචි ජීවිතෙකුට උදව් කරන එකත් ලොකු පිනක්" කියලා.



එක දවසක් ගුරුතුමිය ඇහුවා, "නිපුනි, ඔයා ඇයි හැමෝටම මෙච්චර උදව් කරන්නේ?" කියලා. නිපුනි කිව්වා, "ගුරුතුමියේ, මට හිතෙනවා අපි එකිනෙකාට උදව් කළොත් හැමෝගෙම හිත සැහැල්ලු වෙනවා කියලා. මට සතුටු වෙන්න ඕනේ මම නිසා කවුරු හරි හිනා වෙනවා නම්." ගුරුතුමියට ඇස්වලට කඳුළු ආවා.



අවුරුදු අවසානයේදී ඉස්කෝලේ "හොඳම ළමයා" සම්මානය ලැබුණේ නිපුනිට. ඒත් නිපුනි කිව්වේ, "මේ සම්මානය මට විතරක් නෙවෙයි. මට උදව් කරන්න කියලා දෙන අම්මට තාත්තට, මාව හොඳට හදන ගුරුතුමියට, මගේ යාලුවන්ට හැමෝටමයි." නිපුනිගේ කතාව අහපු හැම ළමයෙක්ම හිතුවා, "අපිත් නිපුනි වගේ වෙන්න ඕනේ" කියලා.



කුඩා උදව්වක් වුණත් ඒක කෙනෙක්ගේ හිත ලොකුවට සතුටු කරන්න පුළුවන්. ආදරයෙන්, කරුණාවෙන් හැසිරෙන කෙනෙක් හැමෝටම ආදශර්යක් වෙනවා.





## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමේ තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)